# රූපවාහිනී සමීක්ෂා



යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා
සංවිභාගශීලි ප්‍රවේශයක්

# රූපවාහිනී සමීක්ෂා

## හත්වන කලාපය

සංස්කරණය

**ආචාර්ය සේන නානායක්කාර**
**නන්දසේන පලිහක්කාර**
**ජී.ඒ. ජිනප්‍රිය**

ප්‍රකාශනය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

# රූපවාහිනී සමීක්ෂා
## හත්වන කලාපය

ප්‍රථම මුද්‍රණය - 2014 ජනවාරි
ISSN 1800-2854

**ප්‍රකාශනය**
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**කංචුකය**
මානව සංහතියෙහි ජීවිත අවදානම හමුවේ
අපි කුමක් කරමු ද?

(සුප්‍රකට ඡායාරූප ශිල්පී කෙවින් කාටර් විසින් ගන්නා ලද ඡායාරූපය
අපේ මාධ්‍ය අචාරධර්ම විෂයයෙහි ලා කරන අනතුරුදායක පූර්විකාවක් ලෙස...)

**පරිගණක අක්ෂර සංයෝජනය සහ පිටු සැලැසුම:**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

**මුද්‍රණය:**
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

**මෙම ලිපි සරණියෙහි අන්තර්ගත ලිපිවල එන අදහස් ඒ ඒ රචකයන් සතු ය. ඒ පිළිබඳ ව සංස්කාරකවරුන්ගේ හෝ ප්‍රකාශකයන්ගේ හෝ කිසිදු වගකීමක් නොමැති බව කරුණාවෙන් සලකන්න.**

**උපදේශකත්වය**

ටී.බී. ඒකනායක

සංස්කෘතික හා කලා කටයුතු ගරු අමාත්‍ය

**අධීක්ෂණය**

වසන්ත ඒකනායක

ලේකම්

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

**විජිත් කණුගල**

අධ්‍යක්ෂ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ප්‍රධාන සම්බන්ධීකරණය**

ජී.ඒ. ජිනප්‍රිය

ලේකම්

රාජ්‍ය රූපවාහිනී කලා අනුමණ්ඩලය

**සම්බන්ධීකරණය**

මහේෂ් චතුරංග විජේසූරිය

ආර්.ජේ.එම්. හෂිකා කරුණාරත්න

සංස්කෘතික සංවර්ධන නිලධාරී

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සංවිධානය කළ
2014 ජනවාරි මස 12 වන දින
කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී
පැවැත්වුණු
2013 රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙලේ දී නිකුත් කෙරිණි.

## පටුන

පිටු

01. මාධ්‍ය ආචාරධර්ම හා රූපවාහිනිය - ටී.එම්.ජී. චන්ද්‍රසේකර 15-20

බී.ඒ., එම්.ඒ. (කැලණිය), දිවයින පුවත්පතේ හිටපු උප කර්තෘවරයෙකි, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයෙකි, රූපවාහිනී අන්තර්ජාතික සමුළු වාර්තාකරුවෙකි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පර්යේෂණ හා පුහුණු ඒකකයේ වත්මන් අධ්‍යක්ෂවරයා ය.

02. යුගයෙන් යුගයට ආචාරධර්ම – සුගත් වටගෙදර 21-33

බී.ඒ. ගෞරව, එම්.ඒ., එම්.එස්.සී., ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකි, ප්‍රවීණ ලේඛකයෙකි, විචාරකයෙකි. රූපවාහිනී විෂය පිළිබඳ උපදේශකවරයෙකි, සිනමා හා රූපවාහිනී සම්මාන උළෙලවල ජූරි සභිකයෙකි, රාජ්‍ය රූපවාහිනී කලා අනුමණ්ඩලයේ සභාපතිවරයා ය.

03. රූපවාහිනියට ආචාරධර්ම…? දඩබ්බරයා හීලෑ කරන ජනහිතකාමී ශික්ෂාපද පිළිබඳ විමසුමක් – ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර 34-43

බී.එස්.සී. (ගෞරව), එම්.ෆිල්., පී.එච්.ඩී. (කැලණිය), ඒ.එන්.පී.ඒ.එස්., එෆ්.එන්.පී.ඒ.එස්., එෆ්.එන්.පී.ඒ.එස්. (ගෞරව) (ශ්‍රී ලං.ජා.ජා.සං.), ඒ.එෆ්.අයි.ඒ.පී. (බෙල්ජියම), කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි, රාජ්‍ය ඡායාරූප කලා අනුමණ්ඩලයේ සභාපතිවරයා ය.

04. සදාචාරවත් දරු පරපුරක් උදෙසා රූපවාහිනිය - ආචාර්ය ලලිතා සිරිබද්දන 44-48

බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.ඒ. (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), පී.එච්.ඩී. (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ළමා වැඩසටහන් හිටපු අංශ ප්‍රධානී, “මුතුහර” නිර්මාතෘ, සිනමා හා ටෙලිනාට්‍ය සම්මාන උළෙලවල ජූරි සාමාජිකාවකි, ලේඛිකාවකි.

05. යහපත් ටෙලිනාට්‍ය කලාවක් ගොඩනැගීම සඳහා - විමලරත්න අදිකාරී 49-53

ජනමාධ්‍ය ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), ලේඛකත්ව හා ජනසන්නිවේදන ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර), ජනමාධ්‍ය ඩිප්ලෝමා (ජාතික තරුණ සේවා සභාව), ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ටෙලිනාට්‍ය ඒකකයේ අධ්‍යක්ෂවරයා ය, සම්මාන දිනූ වේදිකා නාට්‍ය පෙළ රචකයෙකි, නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි, ටෙලිනාට්‍ය තිර රචකයෙකි, අධ්‍යක්ෂවරයෙකි.

06. රූපවාහිනී ප්‍රවෘත්ති සන්නිවේදනයේ දී රක්ෂණය විය යුතු මාධ්‍යවිද්‍යානුකූල ආචාරධර්මීය ප්‍රතිපදාව - ආචාර්ය සේන නානායක්කාර 54-62

බී.ඒ. (ගෞරව), එම්.ඒ. (පර්යේෂණ), පී.එච්.ඩී. (ජනසන්නිවේදනය), ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපතිවරයා ය, ජනසන්නිවේදනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්වරයෙකි, වේදිකා හා ටෙලිනාට්‍ය නළුවෙකි, ගුවන්විදුලි ශිල්පියෙකි, මාධ්‍ය පර්යේෂකවරයෙකි, ගත්කතුවරයෙකි.

07. ප්‍රවේසමෙන් පරිහරණය කරන්න - එම්.ඩී. මහින්දපාල 63-67

ඡායාරූප ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), සම්මානලාභී චිත්‍රපට හා ටෙලිනාට්‍ය කැමරා අධ්‍යක්ෂවරයෙකි, ගත්කතුවරයෙකි, සිනමාව හා රූපවාහිනී විෂය පිළිබඳ විශ්වවිද්‍යාල කිහිපයක බාහිර කථිකාචාර්යවරයෙකි.

08. දර්ශනය, සමාජය සහ ජනමාධ්‍ය ආචාරධර්ම 68-73
- ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්
බී.ඒ. (ගෞරව), එම්.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී. (Wuhan විශ්වවිද්‍යාලය, චීනය), කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ප්‍රාසංගික කලා අධ්‍යයන අංශයේ ජනමාධ්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි, ජනමාධ්‍ය පර්යේෂකයෙකි. ගත්කතුවරයෙකි.

09. සමාජ වගකීම හා ප්‍රචාරණය - මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ 74-77
බී.ඒ., එම්.ඒ. (කැලණිය), පී.එච්.ඩී. (මොස්කව්), රුසියානු භාෂාව පිළිබඳ ඩිප්ලෝමා (මොස්කව්), කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ හිටපු පීඨාධිපතිවරයෙකි, චිත්‍රපට හා ටෙලිනාට්‍ය සම්මාන උළෙලවල ජූරි සභිකයෙකි. ජනමාධ්‍ය පර්යේෂකයෙකි, ප්‍රවීණ ගත්කතුවරයෙකි.

10. පුංචිතිරේ මුහුණු දෙකයි: අපේ රූපවාහිනී මාධ්‍යයේ වාණිජ ස්වරූපය 78-82
- දිලිප අබේසේකර
බී.ඒ. (ජාත්‍යන්තර සම්බන්ධතා හා සමාජවිද්‍යාව) ජිනීවා, ස්විට්සර්ලන්තය, ජනමාධ්‍ය දැන්වීම් ක්ෂේත්‍රයේ ප්‍රකට නිර්මාණ ශිල්පියෙකි. සම්මානිත කලාකරුවෙකි.

11. පුංචි තිරය – නන්දසේන පලිහක්කාර 83-84
බී.ඒ. (පේරාදෙණිය), එම්.ඒ. (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), ලේඛකත්ව හා ජනසන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර), කිවිපති, කාව්‍යභූෂණ, රුහුණු පහන්සිළු (සම්මානිත), ප්‍රකට කිවිවරයෙකි, සංස්කෘතික නිලධාරිවරයෙකි, උපසභාපති - අගනුවර තරුණ කවි සමාජය.

12. නාට්‍ය, ප්‍රාසංගිකත්වය සහ ආචාරධර්මීය පූජා විධි 85-93
- ආචාර්ය ජයලත් මනෝරත්න
බී.ඒ. (ලංකා), එම්.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), ලේඛකත්ව හා ජනසන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර), නවකතාකරුවෙකි, කවියෙකි, ගීත රචකයෙකි, සම්මානිත වේදිකා නාට්‍ය පෙළ රචකයෙකි, අධ්‍යක්ෂවරයෙකි, ටෙලිනාට්‍ය තිර රචකයෙකි, අධ්‍යක්ෂවරයෙකි, දිවයිනේ ප්‍රධාන පෙළේ වේදිකා, සිනමා හා ටෙලිනාට්‍ය රූපණවේදියෙකි.

13. රූපවාහිනී මාධ්‍ය, කලාව සහ ආචාරධර්ම - පියදාස රත්නසිංහ 94-101
බී.ඒ. (ගෞරව), ජනමාධ්‍ය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකි, රංගිරි ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවයේ වත්මන් වැඩසටහන් හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ය.

14. වාර්තා චිත්‍රපට හා බැඳුණු මාධ්‍ය ආචාරධර්ම - නාමල් ප්‍රසන්න 102-112
බී.ඒ. (පේරාදෙණිය), ජනමාධ්‍යවේදී ඩිප්ලෝමා (I.I.M.C. ඉන්දියාව), ලේඛකත්ව හා ජනසන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර), සිනමා ඩිප්ලෝමා (ජාතික චිත්‍රපට සංස්ථාව). ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්තා වැඩසටහන් ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිෂ්පාදකවරයෙකි.

15. පරිගණක සජීවීකරණය සඳහා ආචාරධර්ම 113-121
- එච්.ඩබ්ලිව්. ඩන්ස්ටන් මන්ජුන
පරිගණක සජීවීකරණය පිළිබඳ ප්‍රවීණ ශිල්පියෙකි, 2006 හා 2011 වසරවල හොඳම පරිගණක සජීවීකරණය සඳහා වූ රාජ්‍ය සම්මානලාභියා ය.

16. ආචාරධර්ම, සදාචාරය සහ රූපවාහිනී නිෂ්පාදක - **චන්ද්‍රසිරි බෝගමුව** 122-131

බී.ඒ. ගෞරව (කැලණිය), එම්.ෆිල්. (කැලණිය), පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ජා.අ.ආ), රූපවාහිනී පුහුණු සහතිකය (කොරියාව), රූපවාහිනී වැඩසටහන් සම්පාදකවරයෙකි, ප්‍රවීණ විචාරකයෙකි, කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංගකලා සහ ප්‍රාසංග කලා ඒකකයේ අංශාධිපතිවරයා ය.

17. රූපවාහිනී ආචාරධර්ම හා ශ්‍රී ලාංකේය කාන්තාව - **අමන්දා සමානි ජයවර්ධන** 132-135

බී.ඒ. ගෞරව (කැලණිය), ඒ.එන්.පී.ඒ.එස්. (ශ්‍රී ලං.ජා.ඡා.ක.සං.) කැලණිය විශ්වවිද්‍යාලයීය නාට්‍ය හා රංගකලා සහ ප්‍රතිබිම්බ කලා ඒකකයේ සහය කථිකාචාර්යවරියකි, සම්මානලාභී ඡායාරූප ශිල්පිනියකි.

18. ජන සංස්කෘතියෙහි ලා ආචාරධර්මීය ප්‍රවේශයක් - **ශාන්ත ගුණරත්න** 136-145

බී.ඒ. ගෞරව (කැලණිය), ඒ.එන්.පී.ඒ.එස්., එෆ්.එන්.පී.ඒ.එස්., එෆ්.එන්.පී.ඒ.එස්. ගෞරව (ශ්‍රී ලං.ජා.ඡා.ක.සං.), ජාතික හා ජාත්‍යන්තර සම්මානලාභී ඡායාරූප කලාවේදියෙකි, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ හිටපු විධායක අධ්‍යක්ෂවරයෙකි. ප්‍රකාශන අධ්‍යක්ෂවරයෙකි.

19. රූපවාහිනී දැන්වීම්කරණය සහ ආචාරධර්ම - **ඊ.ඩබ්ලිව්.එම්. ශාලිකා බෝයගොඩ** 146-153

බී.ඒ. ගෞරව, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ භාෂා හා සන්නිවේදන අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරියකි.

20. සංජානනය හා ආචාරධර්ම - **මහාචාර්ය ආරියරත්න ඇතුගල** 154-157

බී.ඒ. (ගෞරව), එම්.ඒ., පී.එච්.ඩී. (කැලණිය), ප්‍රවීණ ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයෙකි, චිත්‍රපට තිර රචකයෙකි, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපතිවරයෙකි, මාධ්‍ය පර්යේෂකයෙකි, ගත්කතුවරයෙකි. කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකි, වත්මන් ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ ජනරාල්වරයා ය.

21. ජනමාධ්‍ය ආචාරධර්ම හා ප්‍රචණ්ඩතාව - **නොයෙල් විජේරත්න** 158-165

බී.ඒ. (ගෞරව), ලලිතකලා, එම්.ඒ. (නාට්‍ය හා රංගකලා), එම්.එස්.සී. (පුරාවිද්‍යා), ලේඛකත්ව හා සන්නිවේදන ඩිප්ලෝමා, කැලණිය හා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංගකලාව පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකි, නාට්‍යකරුවෙකි.

22. සංහතික මාධ්‍ය යථාර්ථය සහ එහි සදාචාරීය දෘෂ්ටිවාදය 166-173
- **ආචාර්ය ටියුඩර් වීරසිංහ**

බී.ඒ., එම්.ඒ. ජනමාධ්‍ය (මොස්කව්), එම්.ඒ. දර්ශනය (මොස්කව්), පී.එච්.ඩී. (මොස්කව්) ප්‍රකට ලේඛකයෙකි, සිනමා හා ටෙලිනාට්‍ය සම්මාන උළෙලවල ප්‍රවීණ ජූරි සභිකයෙකි. ගත්කතුවරයෙකි, ජනමාධ්‍ය පර්යේෂකයෙකි, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිවරයා ය.

23. රූපවාහිනී ළමා වැඩසටහන්, හිංසනය හා ආචාරධර්ම 174-184
- **පාලිත කේ. විජේසිංහ**

බී.ඒ., එම්.එස්.එස්.සී. (කැලණිය), ජනමාධ්‍ය ඩිප්ලෝමා (ජර්මනිය), ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යාපන වැඩසටහන් අංශයේ අධ්‍යක්ෂවරයා ය.

24. ගෝලීය යුගයේ දැන්වීම් සහ මාධ්‍ය සදාචාරය - **මනෝජ් පුෂ්පකුමාර ජිනදාස** 185-199

බී.ඒ. (ගෞරව), එම්.එස්.එස්.සී. (කැලණිය), පශ්චාද් උපාධි ඩිප්ලෝමා (පරිවර්තන අධ්‍යයනය), පශ්චාද් උපාධි ඩිප්ලෝමා (මනෝවිද්‍යාව), සංගීත විශාරද, සංගීත් නිපුන්, ලේඛකයෙකි, කැලණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

25. සාරධර්ම වනසන දැන්වීම්වලින් සිදුවන සමාජ අගතිය - **ජයන්තා රුක්මණී සිරිවර්ධන** 200-207
බී.ඒ. (කොළඹ), එම්.ඒ. (කැලණිය), ජනමාධ්‍ය ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), තිරරචනය ඩිප්ලෝමා (රූපවාහිනී අභ්‍යාස ආයතනය), ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරිණියකි. ප්‍රකට ලේඛිකාවකි. කිවිඳියකි. සිනමා හා රූපවාහිනී නිර්මාණ විචාරිකාවකි. සිනමා හා රූපවාහිනී සම්මාන උළෙලවල ජූරි සභිකාවකි.

26. රූපවාහිනීය සාරධර්ම හා භාෂාව - **මහාචාර්ය තිස්ස ජයවර්ධන** 208-212
බී.ඒ. ගෞරව (ලංකා), පී.එච්.ඩී. (ලන්ඩන්), කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්යවරයෙකි. කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අධ්‍යයන අංශයේ ආරාධිත මහාචාර්යවරයෙකි.

27. රූපවාහිනී ආචාරධර්ම යථාර්ථයක් ද? - **බුද්ධදාස ගලප්පත්ති** 213-215
බී.ඒ. (විද්‍යෝදය), සම්මානිත කිවිවරයෙකි. වේදිකා නාට්‍ය අංග රචනා නිර්මාණකරුවෙකි. ප්‍රකට ජනමාධ්‍යවේදියෙකි. විචාරකයෙකි. රූපවාහිනී පෙරදැකුම් මණ්ඩල සාමාජිකයෙකි, ග්‍රන්ථ කර්තෘවරයෙකි.

28. භාෂා භාවිතයෙහි නිරවද්‍යතාව - **ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර** 216-219
බී.ඒ., එම්.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), පී.එච්.ඩී. (බරණැස), ලේඛකත්ව හා ජනසන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ හා මානවවිද්‍යා අංශයේ හිටපු අංශාධිපතිවරයෙකි. ප්‍රකට ලේඛකයෙකි. ගීත රචකයෙකි. කවියෙකි. දේශකයෙකි. ග්‍රන්ථ කර්තෘවරයෙකි. රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලයේ සභිකයෙකි.

29. වෝල්ටර් බෙන්ජමින්ගේ "තාක්ෂණික ප්‍රතිනිෂ්පාදන යුගය තුළ කලාව" - **මහාචාර්ය ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි** 220-225
බී.ඒ. (ගෞරව), එම්.ඒ., පී.එච්.ඩී. (ලන්ඩන්), පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපතිවරයෙකි. ජනමාධ්‍ය ආචාරධර්ම පිළිබඳ ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය උපදේශකවරයෙකි. ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සිනමා පාඨමාලාවේ දේශකයෙකි. ප්‍රකට විචාරකයෙකි.

30. අපේ රූපවාහිනී ආචාරධර්ම හා ඉන්දියානු ආකෘතිය - **විජයානන්ද රූපසිංහ** 226-234
බී.ඒ. (විද්‍යෝදය), සම්මානිත කිවිවරයෙකි. වේදිකා නාට්‍ය අංග රචනා නිර්මාණකරුවෙකි. ප්‍රකට ජනමාධ්‍යවේදියෙකි. විචාරකයෙකි. රූපවාහිනී පෙරදැකුම් මණ්ඩල සාමාජිකයෙකි, ග්‍රන්ථ කර්තෘවරයෙකි.

31. A Golden Path for Sri Lankan Television - **Kala Keerthi Edwin Ariyadasa** 235-238
Kalakeerthi, Rohana Pradeepa Sahithya Rathna, Veteran Media Specialist in Journalism, Television, Cinema and Sound Broadcasting

32. Let's be ethical in News - **Dushan Vass** 239-243
P.G. Diploma in International Relations (BCIS), MCIM (UK), MSLIM:CPM (Asia), MBCS (UK), Wellknown News Reader and Presenter.

33. Media Regulation and Television News Reporting: A Critical view on Sri Lanka Television Channels - **S. Sivapriya** 244-250
B.A. (Hons.), Lecturer, Department of Languages and Communication Studies, Faculty of Communication and Business Studies, Trncomalee Campus of Eastern University, Sri Lanka.

# දර්ශනය, සමාජය සහ ජනමාධ්‍ය ආචාරධර්ම

**ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**

ආචාරධර්ම යනු දර්ශන (Philsophy) විෂය තුළ සමාජ ක්‍රියා, සමාජ අන්තර්ක්‍රියා සහ මානසික සාධක පාදක කොටගෙන පෝෂණය වන ගැඹුරු විෂයයකි. මෙය සදාචාරය පිළිබඳ මූලධර්ම පදනම් ව කාර්තීකරණය වී තිබේ. සදාචාරය සහ සාරධර්ම යනු එකිනෙකින් ව්‍යුක්ත කළ නො හැකි සංයුක්ත වූ සංකල්ප දෙකකි. ආචාරධර්ම සහ එහි ක්‍රමවේදාත්මක ස්වරූප සෞන්දර්යවේදාත්මක දෘෂ්ටිය තුළ වුව ද ව්‍යුහගත කළ හැකි අතර, එය සාර්ධර්මවේදය (Axiology) පිළිබඳ දර්ශනය ලෙස ද සැලකේ. මෙය කායික, මානසික මෙන් ම සමාජ චර්යාත්මක කාරණාවක් බව ද පැහැදිලි ය. ඒ අනුව මේ තුළින් සමාජ පද්ධති ස්වරූපයක් මෙන් ම මූලධර්මීය (Principles) ලක්ෂණ ද ඉස්මතු වන බව පෙනේ. මෙම සාධක අනුව මෙහි සමාජ විද්‍යාත්මක කාරණා, මනෝ විද්‍යාත්මක කාරණා මෙන් ම ආගමික කාරණාවන් ද බද්ධ වී ඇති බැව් පැහැදිලි ය. ආචාර ධර්ම පිළිබඳ දාර්ශනික ව සමාජය මෙහෙයවීම සොක්‍රටීස් (469 BC - 399 BC) විසින් සිදුකරනු ලබන්නේ ද මෙම පදනමෙහි පිහිටමිනි. (Sahakian & Sahakian, 1993)

මෙම දාර්ශනික මත පිළිබඳ අවධානයේ දී ආචාර ධර්ම යනු දැනුම (Knowledge) පදනම් කොටගත් ක්‍රියාවලියක් වන බවත්, අනෙකුත් සියලු කාරණා මෙයට දෙවෙනි වන බවත් පැහැදිලි වේ. මෙම මූලධර්ම මත ආචාර ධර්ම සංරක්ෂණය වන සමාජය දැනුම් සමාජයක් වන බවත්, එය බිඳ වැටුණු මානව ක්‍රියාවලිය තුළ සමාජයක් පවතී ද යන්න සමාජ විද්‍යාත්මක ව සිතිය යුතු ගැටලුවක් බවත් පෙනේ. යම් සමාජයක් පොදු අරමුණකට පැමිණීම යනු ද ආචාර ධර්මීය ලක්ෂණයකි. එය සමාජයක් යන්න අර්ථවත් වීමේ ප්‍රධාන මූලිකාංගයකි. මේ පිළිබඳ ස්වයං සම්ප්‍රජානනයෙහි (Self-aware) යෙදෙන්නා සමාජ සංවර්ධනයෙහි කෘත්‍යාත්මක අරමුණු සඳහා පිළිපන් කෙනෙකු බවත් මෙයට

පිටුපාන්නා සමාජ පර්යාය තුළ ගැටලු නිර්මාපකයෙකු බවත්, දර්ශනාත්මක සත්‍යතාවකි (Sahakian & Sahakian, 1993).

සමාජයෙහි කේන්ද්‍රීය ලක්ෂය පුද්ගලයා වේ. පුද්ගල ඓක්‍යයෙන් තොර ව, සමාජයක් නිර්මාණය නොවේ. පුද්ගලයා යනු සමාජ පද්ධතියෙහි ක්‍රියාකාරිකයෙකි. ඔහුගේ අවශ්‍යතා සහ ඔහු වටා ගොඩනැඟෙන සියලු කාරණා ඔහුට බලපාන අතර, එය සමාජ කාරණා බවට ද පරිවර්තනය වේ. ඔහු මෙහෙයවන්නේ සමාජ පද්ධතික කාරණාවන් ය. සමජය යන්න ඇති තැන නිදහස නැති බවට ද ඇති තර්කයකි. පුද්ගල ආත්ම ඥාන (Self Knowledge) සංවර්ධනයේ දී මෙම ව්‍යුහීය කාරණා වැදගත් වේ.

පුද්ගලයා සමාජ ජීවිතයේ දී හොඳ (Good) නරක (Evil) කාරණා පිළිබඳ උපග්‍රහණය කර ගන්නා අතර හොඳ ප්‍රවර්ධනය කර ගනු ලබන්නේ සමාජ ක්‍රියා සහ එහි ප්‍රගමන කාර්යය සඳහා ය. හොඳ, නරක යනු සමාජ නිර්මාණයකි. නරක ප්‍රවර්ධනය තුළින් ද සමාජ පර්යායෙහි දිශානතිය වෙනස් විය හැකි ය. බුද්ධිමය සහ ආධ්‍යාත්මික දියුණුව අපරාධමය කාරණා නො කැඳව යි. නිවැරැදි බව විඥානගත වූ කල්හි එය නිරායාසයෙන් ම ක්‍රියාවට නැඟෙන බව ග්‍රීක දාර්ශනික සොක්‍රටීස්ගේ ද මතය යි. මෙහි ප්‍රතිවිරුද්ධ සාධකය ද මෙම තර්කය තුළ ම සාධාරණීකරණය කළ හැකි ය.

ඇරිස්ටෝටල්ට අනුව ආචාරධර්ම යනු ආත්ම සාක්ෂාත්කරණීය (Self-realization) ලක්ෂණයකි. එය අර්ථවත් වන්නේ ඒ ඒ සමාජ සන්දර්භයනට අනුගත ව ය. ආචාර ධර්මවල උපයෝගීතාව සහ එයට අනුගත වීම යනු ඒ ඒ සමාජ සන්දර්භයනට ප්‍රවේශ වීමේ ශක්‍යතාව ප්‍රගුණ කිරීමකි. උපදින විට මිනිසා සමාජීය මිනිසකු නො වූවත් සමාජීය වීමේ ශක්‍යතාව ප්‍රගුණ කළ හැකි අයෙකි. සමාජයෙහි නියම ස්වරූපයන් හඳුනා ගැනීමට නම් එම සමාජයෙහි සාමාජිකයකු බවට පත් විය යුතු ය. මාධ්‍යවේදියා තුළ ගොඩනැඟෙන අසතුට සහ ඉච්ඡාභංගත්වය. එම සමාජ සංසිද්ධීන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයෙන් ඔහු ඉවත් කරයි. ඔහු සමාජ පර්යේෂකයෙකි. ඔහු සතු වෘත්තීය පුහුණුව, සමාජ පිළිබඳ විද්‍යාත්මක දැනුම සහ ඒ පිළිබඳ චින්තනමය හැකියාව, ආචාර ධර්මීය පදනම, සමාජ ප්‍රවර්ධනය සඳහා ගුණාත්මක හැසිරීම ආදිය වෘත්තීය මාධ්‍යවේදියා සාමාන්‍ය මාධ්‍යවේදියාගෙන් වෙන් කරනු ලබන සුවිශේෂී ලක්ෂණ වේ. වෘත්තකභාවය සහ ඒ පිළිබඳ ගැඹුරු දැනුම යනු ද ආචාරධර්මීය ලක්ෂණයකි.

සමාජයේ ගැටුම් ඇති කිරීම සහ ගැටුම් නිවාරණය සඳහා ද ජනමාධ්‍ය හේතු වේ. වෘත්තීය භාවයකින් තොර ව සිදුවන මාධ්‍ය නිෂ්පාදන පුද්ගලයාට, සමාජ සංවිධානවලට සහ සමස්ත සමාජයට ප්‍රබල ගැටලු නිර්මාණය කරයි. ඒ තුළින් සමාජ සංහිඳියාව වෙනුවට සමාජ වෛරය, පුද්ගල සහ සමාජ සංවිධානයන්හි ගරුත්වය (Reputation) සමාජ ආර්ථික බිඳ දැමීම ද සිදු කරයි. යම් රටක හෝ සමාජයක හෝ සමාජ වගකීම් රහිත මාධ්‍ය පවතින විට ජනතාව රැකගැනීමේ අරමුණින් රාජ්‍ය වගකීම් ද ඉදිරියට පැමිණෙන බැව් පෙනේ. ආචාරධර්ම සහ නීතිය යනු ප්‍රධාන සමාජ සංකල්ප දෙකක් වුව ද, ඒ දෙක අතර ප්‍රබල වෙනසක් ද දක්නට ලැබේ. නෛතික තත්ත්වයන් බිඳ දැමීමට ජනමාධ්‍යයට හැකියාවක් නොමැත.

මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී බටහිර ප්‍රධාන මූලධර්ම හතරක් පිළිබඳ ව සාකච්ඡාවට භාජනය කළ හැකි ය. එනම්,

1. සත්‍යවාදී බව - Truth Telling
2. නිදහස - Independence
3. හානිය අවම කිරීම - Minimizing Harm
4. වගකිව යුතු බව - Accountability යනාදී වශයෙනි.

ජනමාධ්‍ය ජනතාවගේ විශ්වසනීය මාධ්‍ය වීම සඳහා තොරතුරුවල නිරවද්‍යතාව (Accuracy) බලපාන අතර, එය සමාජ කෘත්‍යාත්මක සාධකයක් ද වේ. වර්තමානයේ ජනතාව තොරතුරු ලෝකයක ජීවත් වන අතර, එය නිවැරදි නො වන විට ජනමාධ්‍ය සහ ප්‍රජාව අතර පවතින අනුකලනාත්මක සබඳතාව ද බිඳ වැටේ.

ප්‍රජාව ගුණාත්මක මාධ්‍ය ක්‍රියාවලියක් බලාපොරොත්තු වන අතර, එය සත්‍යවාදී (Truth) නිවැරදි සහ සාධාරණ (Accuracy and Fairness) විය යුතු ද වේ. (Commission on Freedom of the Press, 1947) නිවැරදි බව ගොඩනැඟිය යුත්තේ ඒ පිළිබඳ දුටු පමණින් හෝ ඇසූ පමණින් හෝ නොව, ඒ පිළිබඳ ගැඹුරු චින්තනමය සහ පර්යේෂණාත්මක දෘෂ්ටියකිනි. සාධාරණ බව, සත්‍යවාදී බව මත පදනම් වන අතර, එය සිද්ධියට භාජනය වන්නාගේ ප්‍රවේශයේ සිට ගොඩනැංවීම වැදගත් වේ. (Krugner, 2004). සත්‍යවාදී බව මානව වර්ගයාගේ (Human Kind) සහවාසීකරණය සඳහා ඉතිහාසයේ සිට ම ගොඩනැඟුණු ගුණාංගයකි. ගුටෙන්බර්ග්ගේ (Gutenberg) කාලයේ සිට ම මාධ්‍යයේ මූලික ම ගුණාංගයක් ලෙස මෙය ගොඩනැඟුණු බැව් පෙනේ. දර්ශනය ආදී විෂයයන් තුළ, නෛතික ක්ෂේත්‍ර තුළ, ආගමික, දෙමවුපිය, ගුරු ආදී සමාජ පද්ධති තුළ අනුකලනාත්මක බව මෙයට පදනම් ව ගොඩනැඟුණි.

සත්‍යවාදී බව ගිලිහෙන විට සමාජ අනුකලනය සහ විශ්වසනීයත්වය ද බිඳ වැටෙනු ඇත. සත්‍යවාදී බව තුළ මානව ගරුත්වය සුරැකෙන අතර, පුද්ගලයා පරයා යාමේ පදනම් ද බිඳ වැටෙනු ඇත. එමෙන් ම අන්‍යෝන්‍ය තේරුම් ගැනීම් ද ගොඩනැඟෙයි. තොරතුරු අභිනතියෙන් තොර ව සාධාරණීකරණය වීම අත්‍යවශ්‍ය වේ.

ආචාරධර්මීය ස්වරූප සහ එහි හැසිරීම් තුළ මාධ්‍ය නිදහස ගොඩනැඟෙනවා ද නැතහොත් මාධ්‍ය නිදහස සමාජ පද්ධතියට පරිබාහිර සාධකයක් ලෙස සිට සමාජයට බලපෑම් කරන්නේ ද යන්න පිළිබඳ තර්කනය අතිශය වැදගත් ය. නිදහසේ තොරතුරු දැනගැනීම සහ නිදහස් තොරතුරු දැනගැනීම තුළ ඇත්තේ ද ආකෘති දෙකකි. නිදහසේ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇති අතර, නිදහසේ තොරතුරු සහ මත බෙදාදීමේ අයිතිය ද පැවැතීම තුළ මාධ්‍ය වෘත්තිකභාවය (Professionalism) තුළ ගැටලු මතු වේ. ඒ ඕනෑ ම වෘත්තියක් තුළ සමාජ ආචාරධර්ම සහ සාරධර්ම පවතින බැවිනි. මෙය එකිනෙකින් වියුක්ත නො වන, සමපාත ද නොවන පැතිකඩ දෙකකි.

මාධ්‍ය නිදහස යන සංකල්පයේ සීමාව සනිටුහන් වන්නේ කොතැන ද? මාධ්‍ය නිදහස යන සංකල්පය තුළ සමාජ නිදහස සුරැකේ ද? මේ නිසා ම මෙයට ප්‍රතිවිරෝධී මාධ්‍ය මෙන් ම වෘත්තීය ස්වරූපයන් ද (Antithetical Media Profession) ද නිර්මාණය විය හැකි ය.

ගෝලීය සමාජ ක්‍රමවේදය තුළ වාස්තවික වූ විඥානයකින් මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ ගොඩ නැඟෙන සාකච්ඡා මෙන් ම එසේ නො වන දැනුම් ද පවතී. දැනුම යනු සිද්ධියේ ගැඹුරට යාමේ පදනම ගොඩනැඟෙන ස්ථානයයි. මාධ්‍ය ආචාරධර්ම බිඳ වැටීම

යනු ද සමාජය කියවීම සඳහා ඉඩ සකසන තර්කයකි. ආචාරධර්ම බිඳ වැටීම නිසා සමාජයට සිදුවන බලපෑම සහ එහි ගැටලුකාරී බව යන සමාජ කාරණා ඉස්මතු වේ. මාධ්‍යයේ සමාජ බලපෑම අති ප්‍රබල ය. මාධ්‍ය ආචාරධර්ම සහ වගකීම් බිඳ වැටීම තුළ සමාජ ප්‍රගමන ක්‍රියාවලියට බද්ධ වන සමාජ පර්යාය බිඳ වැටීමට හැකි ය. මේ නිසා;

- සමාජයේ ආරක්ෂාවට පවත්නා සිව්වන ආණ්ඩුවේ ක්‍රියාවලිය දුර්වල වේ.
- මාධ්‍ය පිළිබඳ මහජන විශ්වාසය (Public Credibility) බිඳ වැටේ.
- මහජනතාවට සහ සමාජයට හානියක් සිදු වේ.
- සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වුවමනා බිඳ වැටේ.

මානව හැසිරීම් රටාවන්හි ප්‍රධාන චරිතාංග දෙකක් දැකිය හැකි ය. එනම් හිංසාව සහ අන්‍යෝන්‍ය උපකාරය යි. ආචාරධර්ම සහ සදාචාරාත්මක හැසිරීම (Moral Behavior) ගැන සිතීම වැදගත් වන්නේ මුළු විශ්ව ප්‍රජාව ම කායික සහ මානසික අපකාර නොඉවසන බැවිනි. මානව හිමිකම් කෙටුම්පත්වලට අදාළ ව හිමි ව ඇති භාෂණයේ නිදහස සන්නිවේදකයාට ද හිමි වේ. මාධ්‍යවේදියාගේ වෘත්තීයභාවය පිළිබඳ ආරක්ෂාව තහවුරු වන්නේ ඔහු තුළ ගොඩනැගෙන සමාජ ක්‍රියා, අන්තර්ක්‍රියා සහ මනෝ භාවාත්මක තත්ත්ව පිළිබඳ වාස්තවික දැනුම් පදනම්ව ය.

රූපවාහිනිය පරිණාමීය ප්‍රවේශයකට අවතීර්ණ ව ඇත්තා සේ, ඒ තුළින් සමාජ පරිණාමය ද සිදුවෙමින් පවතී. චන්ද්‍රිකා තාක්ෂණය (Satellite Technology) මෙම සමාජ සහ භූගෝලීය සීමාවන් ද අතික්‍රමණය කරමින් බහුවිධ නාළිකා තුළින් මහා සමාජ වපසරියක පැතිරෙමින් පවතී. ඩිජිටල් තාක්ෂණය මෙහි නව ද ක්‍රම විද්‍යාත්මක ස්වරූපයන්හි වර්ධනය සිදුකොට තිබේ. (Herman and Robert, 1997)

21 වන සියවසේ අන්තර්ජාලය, රූපවාහිනිය සහ අනෙකුත් මාධ්‍යයන් ද අන්තර්ජාලයේ ග්‍රහණයට හසු කොටගෙන තිබේ. අන්තර්ජාල ක්‍රමවේදයේ පහසු ව සහ විමධ්‍යගත වීමේ ස්වරූපය අනුව එය ආචාර ධර්ම තුළ නියාමනය කිරීම අතිශය දුෂ්කර කාර්යයක් බවට පත්ව තිබේ.

නූතන මාධ්‍ය සහ නව මාධ්‍ය අතර නියාමන ක්‍රමවේදය තුළ ප්‍රබල වෙනස්කම් දක්නට ලැබේ. නව මාධ්‍යයෙහි නියාමනයේ අපහසු ව සමාජයෙහි මානව හිමිකම් බිඳ වැටීමට ද හේතු වී තිබේ. ඒ අනුව නූතන මාධ්‍යයට වඩා නව මාධ්‍යයෙහි වාරණ ක්‍රියා ලෝකයෙහි සමහර රටවල ප්‍රබල කොට ඇත.

පරිධියේ රටවල ජනමාධ්‍යයට ගෝලීය මාධ්‍ය සහ පාරජාතික මාධ්‍ය (Ward, 2005) බද්ධ වීමේ ප්‍රතිඵල ලෙස මාධ්‍ය ආචාර ධර්මයන්හි නව පරාමිතීන් ද ගොඩනැගී ඇති බැව් පැහැදිලි ය. එමෙන් ම ගෝලීයකරණය ප්‍රාදේශීය මාධ්‍ය සඳහා ප්‍රබල ව බලපෑම් සිදුකොට ඇති බැව් පෙනේ. (Rao, Ward and Wasserman, 2007) බොහෝ රටවල ඒ ඒ සමාජ සන්දර්භයට අනුගත ලෙස ආචාරධර්ම ගොඩනැගී තිබේ. මාධ්‍ය තුළ ආචාර ධර්මීය ගොඩනැගීම් යුක්තිවේදයට (Deontology) අනුගත විය යුතු බැව් පෙන්වා දෙයි. (Kruger, 2004) අනෙක් අතට ගෝලීය මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ කතිකාව පිළිබඳ ගැටලුව ඇති වන්නේ එක් එක් රටවල සමාජ සංස්කෘතික සහ ආගමික තත්ත්වයන්ට අදාළ ව එය සිදු වන බැවිනි. (Cristians, Rao, Ward and Wasserman, 2008) ගෝලීය මාධ්‍ය

ආචාරධර්ම ගොඩනැංවීමේ දී වඩාත් තාර්කික මූලධර්ම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය (Ward, 2005). තවදුරටත් ප්‍රාදේශීය සංස්කෘතික සාධක මූලික වූ ආචාරධර්ම පිළිබඳ චින්තනයක් මානව සමාජයෙහි ගොඩනඟා ගෙන තිබේ. මෙම සංස්කෘතික සාධක නිසා බටහිර නො වන සංස්කෘතික පසුබිම් සැලකිල්ලට ගනිමින් නව ආචාර ධර්ම පිළිබඳ ව සිතිය හැකි ය.

නූතන සහ නව මාධ්‍ය සැලසුම් කරන්නන් පාරිසරික උරුමය සහ අයිතිය (Environmental Claim) ගොඩනැගෙන සේ මෙන් ම සාධාරණ පාරිසරික සහ සමාජ ක්‍රමවේදීය වෙනසකට උචිත බලපෑම් ද (Environmental Impact) සිදුවන සේ සිතීම සාධාරණ ය. එහෙත්, නිදසුන් ලෙස රූපවාහිනිය විසින් ගොඩනඟනු ලබන ආහාර සංස්කෘතිය (Food Culture) තුළ ඉහත සාධාරණ ප්‍රවේශ දෙක ම බිඳ වැටී තිබේ. දාරක ආහාර ක්‍රමවේද පමණක් නො ව, වැඩිහිටි ආහාර ක්‍රම සහ පෝෂණ රටාවල වෙනස්කම් ද නිර්මාණය වීම වෙළෙඳ දැන්වීම්කරණයෙහි එක් ප්‍රතිඵලයකි. මෙය සමාජ වගකීම් සංකල්පයේ ද (Social Responsibility) බිඳ වැටීමකි. වර්තමාන මාධ්‍ය වෙළෙඳ දැන්වීම්කරණයෙහි චිකිත්සීය භාවිතාව (Therapeutic Usage) සමාජ සෞඛ්‍ය සංරක්ෂණීය ක්‍රමවේදයකට වඩා එහි ප්‍රතිපක්ෂ ක්‍රමවේදීය භාවිතය උදෙසා ඇනුම් භාවිත බවෙහි පෙලඹවීම ප්‍රබල කොට තිබේ.

නූතන මාධ්‍ය, විශේෂයෙන් රූපවාහිනී මාධ්‍ය මානව සංජානනය (Perception) වෙනස් කිරීමට සමත් වන අතර ම එක රටක හෝ සමාජයක් හෝ ආර්ථික සමාජ සංස්කෘතික ක්‍රියාවලියෙහි ප්‍රතිබිම්බය බවට ද පත් වේ. එමෙන් ම එය පුද්ගලයාට සමාජ අනුවර්තනීය දිශාව ද පෙන්වා දෙයි. (Muhammad Nasir, 2013) බොහෝ මාධ්‍ය පාරිභෝගිකයන් මාධ්‍යයේ සහ මාධ්‍ය සෞන්දර්ය කලාවේ ප්‍රබලත්වය හඳුනා ගෙන නොමැත. එහෙත්, ප්‍රේක්ෂකත්වයෙහි මනෝ භාවාත්මක තත්ත්ව පිළිබඳ සාක්ෂරතාව (Emotional Literacy) නූතන සහ නව මාධ්‍ය තුළ පැහැදිලි වේ. එහෙත්, මෙම සියලු සමාජ සෞන්දර්යාත්මක කාරණා ආචාරධර්මීය සන්දර්භයකට අනුගත විය යුතු ය. මානව වර්ගයෙහි උදාරත්වය පැහැදිලි වන්නේ සදාචාරාත්මක රාමුව (Moral Framework) තුළ ය. ආචාරධර්ම සහ මනෝ භාවාත්මක ස්වරූප එකිනෙකින් ව්‍යුක්ත කොට මානව, මනෝ ගතික, මනෝ භාවාත්මක සහ සදාචාරාත්මක තත්ත්ව පිළිබඳ සාකච්ඡා කළ නො හැකි ය. මාධ්‍ය ආචාරධර්ම යනු ප්‍රායෝගික ආචාරධර්මවල (Applied Ethics) ප්‍රධාන කොටසකි. මාධ්‍යකරුවා ඉදිරියේ ඇති ප්‍රධාන අභියෝගය ආචාරධර්ම වන අතර, එය යුද්ධය පිළිබඳ ජනමාධ්‍ය තුළින් ද පැහැදිලි වේ. ජනමාධ්‍යවේදියා යනු චිත්තාකර්ෂණීය ප්‍රායෝගික වෘත්තිකයෙකි. වෘත්තීයත්වය යනු කෙටි කාලීන ව නිර්මාණය කර ගත්තක් නො ව, දිගුකාලීන මනෝ භාවාත්මක තත්ත්වයන්ගේ (State of Mindfulness) ප්‍රතිඵලයකි. මාධ්‍යවේදියාගේ කාර්භාරය යනු වගකීම් සහගත එකකි. ඔහු පිළිබඳ සමාජ බලාපොරොත්තුව ඉතා ප්‍රබල ය.

ආචාරධර්ම නිරන්තර බද්ධ වෙන්නේ නිවැරැදි, සාධාරණ, අපක්ෂපාතී, යුතුකම් ඉටුකරන, වගකීම් සහිත ක්‍රමවේද සමඟ ය. මෙය දිගුකාලීන සමාජ සම්ප්‍රදායානුගත ක්‍රියාවලියකි. හිපොක්‍රටික්ගේ දිවුරුම (Hippocratic Oath) තුළ සඳහන් වන්නේ ද යම් ක්‍රියාවකින් සමාජයට හානි සිදු නො විය යුතු බවකි. මෙලෙස ජනමාධ්‍යවේදියා තුළින් ද

සමාජ හානිය අවම විය යුතු (Minimize Harm) අතර, ප්‍රවෘත්ති ආවරණය තුළින් ද බලපෑමට ලක් වන්නන් පිළිබඳ ව සිතිය යුතු වේ. මාධ්‍යවේදීන් සමාජ ගැටලු පිළිබඳ සත්‍ය සෙවීමට, නිදහස් ලෙස ක්‍රියාත්මක වීමට සහ මහජන සේවය සඳහා ආචාරධර්මීය ව බැඳී පවතී. සමහරුන්ගේ තර්කය වන්නේ ආචාරධර්ම ඉගැන්විය නො හැකි බවයි. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට සහ සමාජයෙන් සමාජයට වෙනස් වේ යන අරුත ද එහි ඇති බවට සත්‍යයකි. එමෙන් ම ආචාරධර්මවලට අනුගත නොවීම සහ ආචාරධර්ම සඳහා ප්‍රබල නැඹුරුව ද මානසික රෝග ලක්ෂණයක් බවට ද තර්කයකි.

ආචාරධර්ම පිළිබඳ හැඟීම යනු නිදහස පිළිබඳ හැඟීමකි. සෑම පුද්ගලයෙකුගේ ම මූලික ලක්ෂණය වන්නේ නිදහස සෙවීම ය. නිදහස පිළිබඳ ඉගෙනුම අපහසු වුව ද නිදහස සඳහා අවශ්‍ය ක්‍රමවේදී එළඹුම් පිළිබඳ ඉගෙනුම පහසු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Christians, C., S. Rao, S. Ward and H. Wasserman, (2008). "Toward a Global Media Ethics: Theoretical Perspectives." *African Journalism Studies* 29 (2): 135-172.

*Commission on Freedom of the Press*, (1947). A free and responsible press. Chicago: A free and responsible press. Chicago:

Herman, Edward S. and Robert W. Machesney, (1997). *Missionaries of Global Capitalism,* London: Cassell.

Kruger, F. (2004). *Black, White and Grey: Ethics in South African Journalism,* Cape Town: Double Storey Books.

Nasir Muhammad, (2013). Media Ethics WHY & How? A case study of Pakistan, *IJCRBOI Interdisciplinary Journal of Contemporary Research in Business,* Vol: 4, No: 11. 224-236.

Rao, S. and H. Wasserman. (2007). "Global Media Ethics Revisited. A Postcolonial Critique." *Global Media and Communication* 3 (1): 29-50.

Sahakian, William S. & Sahakian, Mabel Lewis, (1993). *Ideas of the Great Philosophers*. Barnes & Noble Books.

Ward, S. (2005). "Philosophical Foundations for Global Journalism Ethics" *Journal of Mass Media Ethics*: Exploring Questions of Media Morality 20 (1): 3-21